# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
பொலிஸ் ஊடகப் பிரிவு
POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | |
|---|---|---|---|
| දිනය Date: 2025.01.21 පැය 1215 | දුරකථන අංකය Tel.NO: 011-2887973 | මගේ අංකය My NO: D/Media/Out/ 108 /2025 | විද්‍යුත් ලිපිනය E-Mails: dir.media@police.gov.lk |


## මළල ක්‍රීඩා තරඟ ජයග්‍රහණයක් - පොලිස් ක්‍රීඩා කොට්ඨාසය.

දකුණු ඉන්දියානු ප්‍රවීනයන්ගේ මළල ක්‍රීඩා සංගමය මඟින් ප්‍රථම වරට සංවිධානය කරන ලද 2025 දකුණු ආසියානු විවෘත ප්‍රවීනයන්ගේ මළල ක්‍රීඩා ශූරතාවලිය 2025.01.10 වන දින සිට 2025.01.12 වන දින දක්වා ඉන්දියාවේ බැංගලෝර් නගරයේ මංගලා ක්‍රීඩාංගනයේදී පවත්වන ලදී.

මෙම තරඟාවලිය සඳහා රටවල් 04 ක ක්‍රීඩක ක්‍රීඩිකාවන් 1970 ක් පමණ සහභාගී වූ අතර විවිධ වයස් කාණ්ඩ යටතේ මෙම මළල ක්‍රීඩා උලෙළ සඳහා ශ්‍රී ලංකා පොලිසිය නියෝජනය කරන ලද ක්‍රීඩක ක්‍රීඩිකාවන් 07 දෙනෙකු සහභාගී වී පහත ජයග්‍රහණ ලබාගෙන ශ්‍රී ලංකා පොලිසියට කීතර්‍ීයක් අත්කර දී ඇත.

**පො.සැ 37431 ආර්.ඒ.ධම්මික රජපක්ෂ ( වයස අවුරුදු 50 – 54 කාණ්ඩය )**

- මීටර් 400 × 4 සහය දිවීමේ ප්‍රථම ස්ථානය
- මීටර් 400 කඩුලු පැනීම දෙවැනි ස්ථානය
- මීටර් 1500 දිවීම තුන්වන ස්ථානය
- මීටර් 100× 4 සහය දිවීමේ තුන්වන ස්ථානය

**පො.සැ 61923 කේ.එම්.එස් නිරෝෂණ ( වයස අවුරුදු 40- 44 කාණ්ඩය )**

- කවපෙත්ත විසි කිරීම ප්‍රථම ස්ථානය
- යගුලිය විසි කිරීම ප්‍රථම ස්ථානය

**පො.සැ 40484 ටී.ජී.ආර්.එම්.එස් නිරන්ජිත් ( වයස අවුරුදු 35 - 39 කාණ්ඩය )**

- මීටර් 400 දිවීමේ ප්‍රථම ස්ථානය
- මීටර් 100 × 4 සහය දිවීමේ ප්‍රථම ස්ථානය
- මීටර් 400 × 4 සහය දිවීමේ ප්‍රථම ස්ථානය

**පො.සැ 69908 එන්.ජී.යු.එල් නාරාන්විට ( වයස අවුරුදු 35 – 49 කාණ්ඩය )**

- මීටර් 400 කඩුලු පැනීම ප්‍රථම ස්ථානය

- මීටර් 100 × 4 සහය දිවීමේ ප්‍රථම ස්ථානය
- මීටර් 400 × 4 සහය දිවීමේ ප්‍රථම ස්ථානය

**කා.පො.කො 7809 සවිත්‍රා හෂර්ණි ජයකාන්ත ( වයස අවුරුදු 40 - 45 කාණ්ඩය )**

- දුර පැනීම ප්‍රථම ස්ථානය
- උස පැනීම ප්‍රථම ස්ථානය
- මීටර් 800 කඩුලු පැනීම ප්‍රථම ස්ථානය
- මීටර් 100 දිවීම දෙවන ස්ථානය
- මීටර් 100 × 4 සහය දිවීමේ ප්‍රථම ස්ථානය
- මීටර් 400 × 4 සහය දිවීමේ ප්‍රථම ස්ථානය
- මිශ්‍ර සහාය දිවිමේ ප්‍රථම ස්ථානය

පොලිස් මළල ක්‍රීඩා කණ්ඩායමේ සභාපති ලෙස නියෝජ්‍ය පොලිස්පති මහින්ද දිසානායක මහතා කටයුතු කරන අතර ලේකම් ලෙස ජොෂ්ඨ පොලිස් අධිකාරී සුගත් ගලගමගේ, කළමණාකරු ලෙස උප පොලිස් පරික්ෂක වික්‍රමගෙදර , පුහුණුකරු ලෙස ප්‍රධාන පොලිස් පරික්ෂක හෂර් ප්‍රසාද් යන මහත්වරු කටයුතු කරනු ලබයි.

**මෙම අවස්ථාවට අදාල ඡායාරූප කිහිපයක්**


UTH ASIA MASTERS ATHLETIC
PEN CHAMPIONSHIP - 2025
SOUTH INDIA MASTERS ATHLETICS ASSO
1
nubia Focus Pro 5G




1st SOUTH ASIA MASTERS ATHLETICS
OPEN CHAMPIONSHIP - 2025
ORGANIZED BY : SOUTH I MASTERS ATHLETICS ASSOCIATION (R
SIMAA
OPPO F19 Pro
2025.01.12 09:57






**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**